# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 11 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 03/01/2024 පැය 1625

# මාධ්‍ය නිවේදනය

## විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කර ඇත.

එයට සමගාමීව 2024.01.02 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 1188 කට අදාලව සැකකරුවන් 1143 ක් සහ සැකකාරියන් 39 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 44 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිත ඇති අතර සැකකරුවන් 47 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 139 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 152 ක්, ගංජා ග්‍රෑම් 296 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 566 කදී සැකකරුවන් 541 ක් හා සැකකාරියන් 22 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 49 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් හා ගංජා ග්‍රෑම් 2151 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 119 කදී සැකකරුවන් 114 ක් හා සැකකාරියන් 04 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත පරිදි සඳහන් කර ඇත.

2024.01.02 වන දින සිදු කරන ලද වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය(g / mg) | 286.901 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය(g / mg) | 245.971 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 5417.841 |
| | ගංජා පැල | 19052 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය(g / mg) | 355.633 |
| මත්පෙති | | 119 |
| මුළු වැටලීම් ගණන | | 1188 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 39 |
| | පුරුෂ | 1143 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිත සැකකරුවන් ගණන | | 44 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන | | 47 |

2023.12.17 වන දින සිට 2024.01.02 වන දින දක්වා සිදු කරන ලද මුළු වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | |
|---|---|
| මුළු වැටලීම් ගණන | 22918 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | 22746 |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**